ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි
වැඩසටහන- හයවන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
**STU6318-** අන්තර්කරණ අධ්‍යාපනය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.12.02 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. විශේෂ අධ්‍යාපන සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන යනු කුමක්දැයි විස්තර කරන්න.

02. දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනත (2004) අනුව විශේෂ අධ්‍යාපන සේවා ලබා ගැනීමට සුදුසු දරුවන් වර්ග පහක් (05) නම් කරන්න.

03. 'ඌනතාවය' ' දුබලතාවය' 'බාධිත' බව පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්වචනයන්ට අනුව සුදුසු උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිළි කරන්න.

04. ළමුන් තුළ ඇතිවිය හැකි දෘෂ්ටි ගැටලු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ශ්‍රවණ ඌනතා ප්‍රභේද තුන නම් කර ශ්‍රවණ ඌණතාවයන් ඇතිවීමට බලාපන හේතු දෙකක් (02) විස්තර කරන්න.

06. අන්තර්කරණ අධ්‍යාපනයේ මූලධර්ම පහක් (05) ලැයිස්තු ගත කරන්න.

07. පන්තිකාමරයක් තුළ සිසුන්ගේ ඔබ හඳුනා ගන්නා කථන හා භාෂා ගැටලු පහක් (05) නම් කරන්න.

08. 1960 දශකයේ අග භාගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සාමාන්‍ය පාසල තුළ ඒකීකරණ අධ්‍යාපන වැඩසටහන ආරම්භ කෙරිණ. ඒකීකරණ අධ්‍යාපනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. ඒකීකරණ අවධි හතර (04) නම් කරන්න. (ලකුණු 04)

ii. ඒකීකරණය සහ අන්තර්කරණය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. "විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින් ලේබල් කරනවාට වඩා ඔවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන අන්තර්කරණ වාතාවරණයක් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ."

ඉහත ප්‍රකාශය උදාහරණ සහිතව සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

10. "මොළයේ වර්ධනය දෙස බැලූ විට වයස අවුරුදු 05 ට පෙර ළමයෙකුට, භාෂාව හා කථනය පහසුවෙන් ඉගෙන ගැනීමට පුළුවන් බව පෙනී යයි. (SOUSA,2001)"

i. ඉහත ප්‍රකාශය සඳහා ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 05)

ii. නාට්‍ය හා රංගකලාව හදාරණ ගුරු සිසුන් ලෙස ඔබට පන්තිකාමරයේ භාෂණ හා භාෂා ගැටලු සහිත සිසුන්ගේ ප්‍රකාශනය වැඩි දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 07)

III. ඉහත භාෂණ හා භාෂා ගැටලු සහිත සිසුන් තුළ පවතින චිත්තවේග ගැටලු අවම කර ඔවුන් තුළ ස්ව සංකල්පය වර්ධනය කිරීමට ඔබට සහය විය හැක්කේ කෙසේදැයි උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 08)

11. I. ඔටිසම් පරාසීය අක්‍රමතාව සහිත දරුවන් තුළ දැකිය හැකි පොදු ලක්ෂණ පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

II. ඔටිසම් සහිත දරුවන්ගේ සන්නිවේදන කුසලතා දියුණු කිරීමට නාට්‍ය හා රංගකලා හදාරණ ගුරුවරයෙක් ලෙස ඔබට යොදාගත හැකි උපාය මාර්ග මොනවා ද? උදාහරණ හතරක් (04) ඇසුරෙන් සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

III. ඔටිසම් සහිත දරුවන්ට ශ්‍රී ලංකාවේ අන්තර්කරණ පන්තිකාමර තුල සිදුකරන පුද්ගලානුබද්ධ ඉගෙනුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා සාකච්ඡා කරන්න. (ලකුණු 07)

12. I. ඔටුසම්ගේ සහ ලක්ෂණ සහිත දරුවන් හඳුනාගත හැකි ගතිලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

II. අන්තර්කරණ පන්තිකාමරවල ඔටුසම්ගේ සහලක්ෂණ සහිත දරුවන් සඳහා යොදා ගත හැකි විෂයමාලා අනුවර්තන ක්‍රම පහක් (05) යෝජනා කර ඉන් තුනක් (03) උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

III. ඔටුසම්ගේ සහලක්ෂණ සහිත දරුවන් සඳහා අනුවර්ති කුසලතා දියුණු කිරීමට නාට්‍ය හා රංගකලාව උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක කළහැකි ක්‍රියාකාරකම් පහක් (05) යෝජනා කරන්න. (ලකුණු 08)

13. I. සුවිශේෂී ඉගෙනුම් දුබලතාවය ඔබේ වචනයෙන් නිර්වචනය කර සුවිශේෂී ඉගෙනුම් දුබලතා ප්‍රධාන වර්ග තුන **(03)** දක්වන්න. (ලකුණු 03)

II. ඉන් එක් ඉගෙනුම් දුබලතාවක් හඳුනා ගතහැකි ලක්ෂණ පහක් **(05)** ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. අන්තර්කරණ පන්තිකාමරයක සිටින ඉහත සුවිශේෂී ඉගෙනුම් දුබලතා එකක් සහිත දරුවෙකු තෝරාගෙන එම ඉගෙනුම් දුබලතාවය අවම කර ගැනීමට නාට්‍ය හා රංගකලාව යොදා ගන්නේ කෙසේදැයි ක්‍රියාකාරකම් පහක් **(05)** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

14. I. අන්තර්කරණ අධ්‍යාපනය ලංකාවේ ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමාන ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුල ඇති අභියෝග හතරක් (04) නම් කරන්න. (ලකුණු 04)

II. අන්තර්කරණ පන්තිකාමර තුල ක්‍රියාත්මක වන විෂයමාලාව එහි ඉගෙනුම ලබන විශේෂ අවශ්‍යතා දරුවන්හට බලපාන ආකාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

III. අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ සමාජානුයෝජනය සඳහා වැඩි ඉඩ ප්‍රස්ථාවක් හිමි වේ. සුදුසු උදාහරණ ආශ්‍රයෙන් මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.